# දළ දේශීය නිෂ්පාදිතය

## 2023 වසර සහ සිව්වන කාර්තුව - නිෂ්පාදන ප්‍රවේශය

පදනම් වර්ෂය 2015

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 වසරේ සිව්වන කාර්තුව සහ 2023 වසර සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර නිකුත් කර ඇත.

ඒ අනුව 2023 වසරේ ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් යටතේ පිළිවෙලින් රුපියල් මිලියන 27,629,665 ක් සහ රුපියල් මිලියන 11,881,736 ක් වශයෙන් වාර්තා වේ. 2022 වසර සඳහා මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 24,063,762 ක් සහ රුපියල් මිලියන 12,161,201 ක් වශයෙන් වාර්තා විය.

- 2022 වසරේ වාර්තාවූ සියයට 7.3 ක සෘණ වර්ධනයට සාපේක්ෂව 2023 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 2.3 ක පසුබැසීමක් වාර්තාකර ඇත.
- 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 2.6 ක ධන වර්ධනයක්ද, කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 9.2ක් සහ සේවා ආර්ථික කටයුතු සියයට 0.2 ක් වශයෙන් සෘණ වර්ධනයක්ද වාර්තාකර ඇත.
- ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්ත, කර්මාන්ත, සේවා ආර්ථික කටයුතු 2023 වසරේදී දළ දේශීය නිෂ්පාදිතය සඳහා පිළිවෙලින් සියයට 8.3ක්, සියයට 25.6ක්, සියයට 59.9ක් වශයෙන් දායකත්වය ලබාදී ඇති අතර භාණ්ඩ හා සේවා මත අයකෙරෙන සහනාධාර අඩුකළ බදු සියයට 6.2ක් වශයෙන් දායකත්වය ලබා දී ඇත.
- 2022 වසරේ සිව්වන කාර්තුවේ දී වාර්තා වු සියයට 12.4ක සෘණ වර්ධනයට සාපේක්ෂව 2023 සිව්වන කාර්තුවේ

**අන්තර්ගතය**

2023 වර්ෂයේ ආර්ථිකයේ සාමාන්‍ය හැසිරීම - පිටුව 2
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 4
කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 6
සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 8
2023 වසරේ සිව්වන කාර්තුවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු - පිටුව 11

Source Publication

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

## 1.0 2023 වසර සහ සිව්වන කාර්තුව සඳහා සමස්ත ආර්ථිකයේ හැසිරීම

2023 වර්ෂය සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2023 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 2.3 ක පසුබෑසීමක් වාර්තා කර ඇති බවයි.

තව ද, 2022 වර්ෂයේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 12,161,201 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2023 වර්ෂයේ දී රුපියල් මිලියන 11,881,736 ක් දක්වා පහත වැටී ඇත.

රූපසටහන 01
**ප්‍රධාන ආර්ථික කටයුතුවල වර්ධනය - 2022 සහ 2023**




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2023 වර්ෂයේ දී පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 8.3 ක්, සියයට 25.6 ක්, සියයට 59.9 ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2023 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 6.2 ක් ලෙස වාර්තා වේ.

2023 වර්ෂය තුළ දී ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 2.6 ක ධන වර්ධනයක් ද, කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ක්‍රියාකාරකම් පිළිවෙලින් සියයට 9.2 ක සහ සියයට 0.2 ක පසුබෑසීම් වාර්තා කර ඇත.

2023 වර්ෂයේ පළමු භාගයේ දී රට තුළ පැවති ආර්ථික වාතාවරණයට වඩා වෙනස් ආර්ථික තත්ත්වයක් මෙම වර්ෂය අවසාන භාගය තුළ දක්නට ලැබිණි. 2023 වර්ෂයේ පළමු හා දෙවන කාර්තුවලදී ඍණ වර්ධන වේගයන් වාර්තා කළ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වර්ෂයේ අවසාන භාගයේ දී ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. විනිමය අනුපාතිකය සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිතතාවය සමනය වීමෙන් පසු විදේශ ප්‍රේෂණ ලැබීම් ක්‍රමානුකූල වීමත් දැකිය හැකි වූ අතර සංචාරක පැමිණීම් ඉහළ යෑම ආර්ථිකය තුළ නව අපේක්ෂාවන් දල්වන්නට සමත් වී ඇත.

කෙසේ වෙතත් ඉහළ මට්ටමක පැවති යෙදවුම් මිල ගණන් තවදුරටත් විශේෂයෙන් සමහර නිෂ්පාදන කර්මාන්ත කටයුතු සහ ඉදිකිරීම් කර්මාන්ත කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපාමින් පැවතීම දැකි ය හැකිය. 2022 වර්ෂයට සාපේක්ෂව කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් හිඟයකින් තොරව ලබා ගත හැකි වීම බෝග වගාවන් සහ වී වගාව සම්බන්ධයෙන් ධන වර්ධනයන් වාර්තා වීමට ඉවහල් වී ඇත.

2022 වර්ෂයේ දී සියයට 4.2 ක ඍණ වර්ධන වේගයක් වාර්තා කර තිබූ කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු 2023 වර්ෂයේ දී සමස්තයක් වශයෙන් සියයට 2.6 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

2023 වර්ෂයේ දී කෘෂිකාර්මික කටයුතුවල වාර්තා වී ඇති මෙම ධනාත්මක වර්ධනය තුළ 'වී වගා කිරීම' (සියයට 20.0), 'අනෙකුත් ස්ථිර බෝග' (සියයට 8.9), 'පළතුරු වගා කිරීම' (සියයට 7.2), 'කරදිය ධීවර කටයුතු' (සියයට 4.9), 'එළවළු වගා කිරීම' (සියයට 3.2), 'ධාන්‍ය වගා කිරීම' (සියයට 2.9), 'සත්ව නිෂ්පාදනය' (සියයට 1.8), 'කෘෂිකාර්මික සහාය සේවා කටයුතු (සියයට 1.5), වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කෙසේ වෙතත් මෙම වර්ෂය තුළ දී 'පැළ බෝකිරීම' (සියයට 24.7), 'රබර් වගා කිරීම' (සියයට 7.7), උක්, දුම්කොළ, සහ අනෙකුත් ස්ථිර නොවන බෝග වගා කිරීම'(සියයට 7.6), 'කෝපි, කොකෝවා වගා කිරීම' (සියයට 7.6), 'වන වගා සහ දැව කදන් නිෂ්පාදනය' (සියයට 7.3), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 3.6), 'මිරිදිය ධීවර කටයුතු (සියයට 3.4.), 'කුළුබඩු වගා කිරීම' (සියයට 1.7) සහ 'තේ වගා කිරීම' (සියයට 1.5) ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2022 වර්ෂයේ දී සියයට 16.0 ක සෘණාත්මක වර්ධනයක් වාර්තා කර තිබූ කර්මාන්ත ආර්ථික කටයුතු 2023 වර්ෂයේ දී ද සියයට 9.2 ක පසුබෑසීමක් වාර්තා කර ඇත.

පසුගිය වර්ෂය හා සසඳන විට නිමැවුම් කර්මාන්ත කටයුතු සමස්තයක් වශයෙන් සියයට 3.2 ක පසුබෑසීමක් වාර්තා කර ඇත. නිමවුම් කර්මාන්ත කටයුතු තුළ පසුබෑසීම් වාර්තා වී ඇති නිමවුම් කර්මාන්ත අතර 'දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන'(සියයට 20.0), 'රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 16.8), 'වෙනත් නිමවුම් කර්මාන්ත' (සියයට 15.6), 'යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය' (සියයට 15.1), 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' (සියයට 12.0), 'කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය' (සියයට 9.2), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 7.8), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 0.6), ක් වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත.

2023 වර්ෂයේ දී 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' සියයට 238.2 ක සැලකිය යුතු ධන වර්ධනයක් වාර්තා කර ඇත. එමෙන්ම ධන වර්ධනයන් වාර්තා කර ඇති නිමවුම් කර්මාන්ත අතර දළ දේශීය නිෂ්පාදිතයට සියයට 7.0 දායකත්වයක් සහිත ප්‍රධානතම නිමැවුම් ආර්ථික කටයුත්ත වන 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය' සියයට 3.5 කින් වර්ධනයවී ඇත. 'මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 2.6) සහ 'රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය' (සියයට 0.7) ක් ලෙස වර්ධනය වී ඇත.

කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම් තුළ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 5.1 ක දායකත්වයක් සපයන 'ඉදිකිරීම් කර්මාන්තය' සියයට 20.8 ක සෘණ වර්ධනයක් 2023 වර්ෂයේ දී වාර්තා කර ඇත. තව ද, 'පතල් හා කැනීම් කර්මාන්තය' සියයට 22.3 ක පසුබෑසීමක් මෙම වර්ෂය තුළ දි වාර්තා කර ඇත. මේ අතර 'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම' සියයට 2.3 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇති අතර 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරිම සහ බෙදා හැරීම' සියයට 17.6 ක පසුබෑසීමක් මෙම වර්ෂය තුළ දි වාර්තා කර ඇත.

2023 වර්ෂයේ දී සේවා ආර්ථික කටයුතු 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 0.2 ක පසුබෑසීමක් වාර්තා කර ඇත. සේවා ආර්ථික කටයුතුවල වාර්තාවී ඇති මෙම සුළු පසුබෑසීම තුළ 'තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේ කටයුතු' (සියයට 21.4), 'මූල්‍ය සේවා ක්‍රියාකාරකම්' (සියයට 10.0), 'දේපොළ වෙළඳාම් කටයුතු සහ නිවාස අයිතිය' (සියයට 6.0), 'විදුලි සංදේශ සේවා' (සියයට 2.2), 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්' (සියයට 2.1), 'රාජ්‍ය පරිපාලනය' (සියයට 1.7), 'සෞඛ්‍ය සේවා' (සියයට 0.7), ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කෙසේ වෙතත්, 'නවාතැන් හා ආහාර පාන සැපයීම' (සියයට 26.0), 'රක්ෂණ සේවා' (සියයට 26.0), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 3.9), 'තැපැල් හා කුරියර් සේවා' (සියයට 2.9), 'වෘත්තීය සේවා' (සියයට 2.4), 'අධ්‍යාපනය' (සියයට 1.8), 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 0.4) ක් වශයෙන් 2023 වර්ෂය තුළ ධන වර්ධනයන් වාර්තා කර ඇත. ඊට අමතරව, පසුගිය වසර හා සැසඳීමේ දී දළ දේශීය නිෂ්පාදිතයට සියයට 14.0 ක දායකත්වයක් සපයන 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 0.1) ක වර්ධනයක් වාර්තා කර ඇත.

කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය 2022 වර්ෂයේ දී 197.9ක් (2015=100) ලෙස වාර්තා වන අතර 2023වර්ෂයේ දී 232.5ක් ලෙස වාර්තා විය. ඒ අනුව දළ දේශය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව 2023 වර්ෂයේ දී මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 17.5 කි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය ( NCPI ) (2021=100) 2022 වර්ෂයේ දී 174.9ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2023 වර්ෂයේ දී 203.8ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2022 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 16.5කි.

## 1.1 කෘෂිකාර්මික ආර්ථික කටයුතු

2023 වර්ෂයේ දී සමස්තයක් ලෙස කෘෂිකාර්මික ආර්ථික කටයුතු, 2022 වර්ෂයේ වාර්තා වූ සියයට 4.2ක සෘණ වර්ධනය හා සසඳන විට සියයට 2.6ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,288,020 ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 934,248 ලෙස වාර්තා වේ.පවත්නා මිල ගණන් යටතේ 2023 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 8.3ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 02
**කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - 2023**




**මූලාශ්‍රය:**
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2022 වසරේ වාර්තා වූ සියයට 24.8 ක සෘණ වර්ධන වේගය හා සසඳන විට 2023 වසර සඳහා "ධාන්‍ය වර්ග (සහල් හැර)" වගා කිරීම උප ක්‍රියාකාරකම සියයට 2.9 ක ධනාත්මක වර්ධන වේගයක් වාර්තා කර ඇත. ප්‍රධාන බෝග කීපයක් වන සෝයා බෝංචි සියයට 97.1 කින් ද, බඩඉරිඟු සියයට 10 .4 කින් ද, රටකජු සියයට 5.5 කින් ද, උඳු සියයට 4.0 කින් ද, තල සියයට 1.9 කින් ද වර්ධනයවී ඇත. කෙසේ වෙතත් සමහර බෝග කීපයක්, එනම් කුරක්කන් සියයට 26.7 කින් ද, 'මුං ඇට' සියයට 13.0කින් ද සහ 'කව්පි' සියයට 18.9 කින් ද පෙර වර්ෂයට සාපේක්ෂව වර්ධනය අඩු වී ඇත.

'වී වගා කිරීම' ආර්ථික කටයුත්ත සියයට 20.0 ක වර්ධනයක් 2023 වසරේ දී වාර්තා කර ඇත. එමගින් ස්ථාවර මිල (2015) ගණන් යටතේ 2023 වසරේ දළ දේශිය නිෂ්පාදතයට රුපියල් මිලියන 113,690ක වටිනාකමක් එකතු කර ඇත. 2023 වසරේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 0.7කි.

එළවලු වගා කිරීම උප ආර්ථික කටයුත්ත 2023 වර්ෂයේ දී සියයට 3.2 වර්ධනයක් වාර්තා කර ඇති අතර එහිදි 2023/2022 මහ කන්නයේ අස්වැන්න මත පදනම් වු ඇස්තමේන්තු මේ සඳහා විශාල වශයෙන් දායක වී ඇත. ඒ අනුව 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී ඉහළ වර්ධනයක් මේ ආර්ථික කටයුත්තේ නිරීක්ෂණය කළ හැකි අතර සිව්වන කාර්තුවේ දී පසුබැසීමක් වාර්තා වී ඇත.

“තෙල් සහිත පලතුරු වගාව” යන ආර්ථික ක්‍රියාකාරකම ප්‍රධාන වශයෙන් පොල් වගාව, තැඹිලි වගාව හා කටුපොල් වගාව යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වන අතර 2023 වර්ෂය තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 107,223 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 0.7ක දායකත්වයක් ලබාදී ඇත. 2022 වර්ෂයේ නිෂ්පාදනය කළ පොල් ගෙඩි මිලියන 3,391 ට සාපේක්ෂව මෙම වර්ෂයේදී පොල් ගෙඩි නිෂ්පාදනය මිලියන 3,169 දක්වා පහල ගොස් ඇත. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී කටුපොල් නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. 2023 වර්ෂයේ දී “තෙල් සහිත පළතුරු වගා කිරීම” යන සමස්ත ආර්ථික කටයුත්ත සියයට 3.6ක පසුබැස්මක් වාර්තා කර ඇත. එමෙන්ම මෙම වසර තුළ පොල් ගෙඩි අපනයනය පොල් ගෙඩි දහස් 14,130 වන අතර 2022 වර්ෂයට සාපේක්ෂව එය සියයට 5.6 කින් පමණ වැඩි වී ඇති අතර තැඹිලි අපනයනය ද සියයට 18.7 කින් වැඩි වී ඇත. 2022 වර්ෂයට සාපේක්ෂව මෙම වසර තුළ දී පොල් ගෙඩියක සහ තැඹිලි ගෙඩියක නිෂ්පාදකයාගේ මිල ගණන් පිළිවෙලින් සියයට 13 හා සියයට 25 ක් වැඩි වී ඇත.

“තේ වගා කිරීම” ආර්ථික කටයුත්ත 2023 වසරේ දී සියයට 1.5 ක පසුබෑමක් වාර්තා කර ඇත. එමගින් ස්ථාවර මිල (2015) ගණන් යටතේ 2023 වසරේ දළ දේශීය නිෂ්පාදනයට රුපියල් මිලියන 61,912ක වටිනාකමක් එකතු කර ඇත. එහිදී සමස්ත තේ නිෂ්පාදනය සියයට 1.7 කින් වර්ධනය වී ඇත. සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 60.6 ක පමණ දායකත්වයක් ලබාදෙන පහතරට තේ නිෂ්පාදනය සියයට 0.03 ක සුළු පසුබැස්මක් මෙම වසරේ දි වාර්තා කර ඇත. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්තා වලට අනුව 2023 වසරේ දී තේ කිලෝග්‍රෑම් මිලියන 241.9 ක් අපනයනය කර ඇති අතර එය සියයට 3.3ක පසුබෑමක් වාර්තා කර ඇත. තව ද කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක මිල රුපියල් 1,171.29 දක්වා 2023 වසරේ දී අඩුවී ඇති අතර එය 2022 වසරේ දී රුපියල් 1,234.24 ක් ලෙස වාර්තා විය.

“රබර් වගා කිරීම” ආර්ථික කටයුත්ත 2023 වසරේ දී සියයට 7.7ක පසුබෑමක් වාර්තා කර ඇත. මෙමගින් ස්ථාවර මිල (2015) ගණන් යටතේ 2023 වසරේ දළ දේශීය නිෂ්පාදිතයට එකතු කල වටිනාකම රුපියල් මිලියන 22,025 ක් වන අතර මෙය 2023 වසරේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 0.2ක දායකත්වයක් ලබා දෙනු ලැබේ. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, 2023 වසරේ දී සකස් කළ රබර් කිලෝ ග්‍රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් වල සාමාන්‍ය මිල රු. 811.20 සිට රු. 655.17 දක්වා සියයට 19.2 කින් අඩුවී ඇත.

“අනෙකුත් ස්ථිර බෝග වගා කිරීම” උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම රා මැදීම සහ කොට්ටකිලංගු වගා කිරීම යන ආර්ථික ක්‍රියාකාරකම් වල එකතුවෙන් සමන්විත වේ. 2023 වර්ෂයේ දී මෙම සමස්ත ආර්ථික කටයුත්ත ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 29,979ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 8.9 ක වර්ධනයක් වාර්තා කර ඇත.

‘සත්ත්ව නිෂ්පාදනය’යන ආර්ථික කටයුත්ත කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය හා මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙම ආර්ථික ක්‍රියාකාරකම 2023 වර්ෂයේ දී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 84,812ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 1.4 ක දායකත්වයක් ලබාදී ඇත. මෙම වර්ෂය තුළ දී සත්ත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 1.8ක සුළු වර්ධනයක් වාර්තා කර ඇත. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අනුව, 2022 වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂය තුළ මස් පිණිස ගවයන් ඇති කිරීමසහ බිත්තර නිෂ්පාදනය යන ආර්ථික ක්‍රියාකාරකම් වල පසුබැස්මක් වාර්තා කර ඇත. මේ කාලසීමාව තුළ කිරි, බිත්තර සහ මස් පිණිස ඇති කරන සියලුම සතුන්ගේ නිෂ්පාදකයාගේ මිල ගණන් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

“පැළ හා බීජ ප්‍රවර්ධනය” යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ රට තුළ පොල්, තේ, රබර්, කුරුඳු, ගම්මිරිස්, මල් හා පලතුරු යන පැළ වර්ග නිෂ්පාදනය කිරීමයි. 2022 වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂය තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 727 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 24.7 ක සැලකිය යුතු පසුබැස්මක් වාර්තා කර ඇත. 2022 වර්ෂයට සාපේක්ෂව මේ වර්ෂය තුළ පොල් පැළ, තේ පැළ, රබර් පැළ හා පළතුරු පැළ නිෂ්පාදනය සැලකිය යුතු අඩු වී ඇත.

වී වගාවේදී, කුඹුරු බිම් සකස් කිරීමේදී හා අස්වනු නෙලීමේදී පිලිවෙලින් රෝද හතරේ හා රෝද දෙකේ ට්‍රැක්ටර් මෙන්ම ඒකාබද්ධ අස්වනු නෙලීමේ යන්ත්‍ර (Combined Harvestor) යොදා ගනු ලබයි. එම සේවය ලබා දීම තුලින් ආර්ථිකයට ජනනය වන ආර්ථික විටිනාකම මෙහිදී සලකනු ලබනයි. එය මෙම ආර්ථික කටයුත්තෙහි ප්‍රධාන සංරචකයි. ඊට අමතරව බඩ ඉරිඟු ඇතුළු ධාන්‍ය වගා භෝග කිහිපයක් හා එළවළු භෝග කිහිපයක් සඳහා එලෙස පස සකස් කිරීමට යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමේ පිරිවැය ඔස්සේ ඒ සඳහා වන යාන්ත්‍රික සහායක සේවා සැපයුම මීට එකතු කරනු ලබයි. කෙසේ නමුත් 2023 වර්ෂයේදී, වී වගා බිම් ප්‍රමාණය ඉහළ ගිය අතර ඒ අනුව එම බිම් ප්‍රමාණය තුල කෘෂි යන්ත්‍රෝපකරණ යෙදවුම් ද ඉහළ ගොස් ඇත. මෙම ඉහළ යාම කෘෂි සහායක කාර්යයන්හි සියයට 1.5 ක වර්ධනය කෙරෙහි හේතු විය.

වන සම්පත් හා දැව කඳන් නිෂ්පාදනය යන ආර්ථික කටයුත්ත තුල ප්‍රධාන දායකත්වය නියෝජනය වන්නේ දර නිෂ්පාදනය හා දැව කඳන් නිෂ්පාදනය තුලින් ජනනය වන වටිනාකමයි. දර නිෂ්පාදනය තුලින් ආර්ථිකයට එකතු වන අගය ඇස්තමේන්තු කරනු ලබන්නේ දර පරිභෝජන අවශ්‍යතාව ඇස්තමේන්තු කිරීම ඔස්සේය. පරිභෝජන අවශ්‍යතාවය ගෘහස්ථ, කර්මාන්ත සහ වෙනත් වශයෙන් වෙන් වෙන්ව ඇස්තමේන්තු කරනු ලබයි. රටේ පැවති ගෘහස්ථ ගෑස් අවශ්‍යතාව පසුගිය වසරට සාපේක්ෂව ක්‍රමයෙන් සාක්ෂාත් කරගැනීමත් මිළ මට්ටමේ අඩුවීමත් නිසා, පසුගිය අවුරුද්දේ සිවුවෙනි කාර්තුවේ සිට ගෘහස්ථ දර ඉල්ලුම ක්‍රම ක්‍රමයෙන් පහළ ගොස් ඇත. මෙම ඉල්ලුම අඩු වීම නිසා, දර නිමැවුම තුලින් ආර්ථිකයට ලැබෙන දායකත්වය, සාපේක්ෂව අඩුවී ඇත. කෙසේනමුත්, පසුගිය වසරේ මිළ ට සාපේක්ෂව දර වල මිළ තවමත් ඉහළ නිසා පවත්නා මිළ ට අනුව එකතු කල අගය ඉහළ මට්ටමක ඇත. ඉදිකිරීම් ක්ෂෙත්‍රය තවමත් යථා තත්ත්වයට පත්ව නොමැති නිසා, දැව කඳන් නිෂ්පාදනය අඩු වී ඇත. තවද, රාජ්‍ය දැව සංස්ථාවේ දැව කඳන් නිෂ්පාදනය ද 10. 7 කින් පමණ පහළ යාමක් මේ වසරේදී වාර්තා කොට ඇත. ගෘහභාණ්ඩ නිෂ්පාදනය මේ වසරේ මුල් කාර්තු වල අඩු වීමක් පෙන්නුම් කරන හෙයින් ඒ සඳහා වන දැව කඳන් ඉල්ලුමද අඩු වී ඇත. ඒ අනුව, ස්ථාවර මිළ ගනන් අනුව මෙම ආර්ථික කටයුත්ත මෙම වසර තුල සියයට 7.3 කින් පසුබැසීමක් පෙන්නුම් කරයි.

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ආර්ථික කටයුත්ත පවත්නා මිළ අනුව එකතුකළ වටිනාකම රුපියල් මිලියන 272,770 ක් වන අතර එය දළ දේශීය නිෂ්පාදිතය තුළ සියයට 1.0 ක දායකත්වයක් දරයි. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී කරදිය මත්ස්‍ය නිෂ්පාදනය එකතු කල වටිනාකම සියයට 4.9 කින් ඉහලයැමක් දක්නට ලැබේ. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ වාර්තාවලට අනුව කරදිය මත්ස්‍ය නිෂ්පාදනය 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වසරේදී සියයට 4.8 ක වැඩිවීමක් දක්නට ලැබෙන අතර එය ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 0.9 කින් හා වෙරළාශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය සියයට 8.2 කින් වර්ධනය වී තිබේ.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ වාර්තාවලට අනුව 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 3.4 කින් අඩුවීමක් දක්නට ලැබේ.

## 1.2 කර්මාන්ත ආර්ථික කටයුතු

2022 වසරට සාපේක්ෂව 2023 වර්ෂයේ දී සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 9.2ක සෘණ වර්ධන වේගයක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 7,071,153 ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 3,003,096 ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2023 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 25.6ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 03
කාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - 2023




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2023 වර්ෂයේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.5 ක් නියෝජනය කරන පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත, 2023 වර්ෂයේ දි සියයට 22.3ක පසුබෑමක් වාර්තා කර ඇත. පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත ආර්ථික ක්‍රියාකාරකම් තුනක් වන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම, මැණික් කැනීම හා අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැනීම් වලින් සමන්විත වේ. එහිදි මෙහි එකතුකළ අගයෙන් සියයට 85ක් පමණ ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම් මගින් ලැබෙන අතර එය 2023 වර්ෂයේ දි සියයට 26.03ක පසුබෑමක් වාර්තා කර ඇත. තව ද ඛනිජ ද්‍රව්‍ය කැනීම් සියයට 15ක පමණ අඩුවීමක් 2023 වර්ෂයේ දී වාර්තා කර ඇත. කෙසේ වෙතත් මැණික් කැනීම් මෙම වසරේදී සියයට 16.9ක පමණ වර්ධනයක් පෙන්නුම් කරන නමුත් එමගින් එකතුකරන අගය පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත තුළ දෙනු ලබන දායකත්වය සියයට 13.5ක් පමණ වේ.

“විදුලිය, ගෑස්, උණුසුම් වායු සැකසුම් සැපයුම” උප ආර්ථික කටයුත්ත සම්බන්ධයෙන් ගත්කළ සමස්ත විදුලිය ජනනය 2022 වර්ෂයේ වාර්තා වූ ගිගාවෝට් පැය 15,792 සිට 2023 වර්ෂයේ දී ගිගාවෝට් පැය 15781 දක්වා සියයට 0.1 කින් පමණ අඩුවී ඇත. මෙහිදි ජල විදුලි ජනනය සියයට 15 කින් පමණ අඩුවී ඇති අතර තාප හා ගල් අඟුරු විදුලි ජනනය සියයට 2.4 කින් වැඩිවී ඇත. විශේෂයෙන් පුනර්ජනනීය විදුලිය ජනනය සියයට 21.4 කින් පමණ 2023 වර්ෂයේ දී වැඩිවී ඇත. තව ද 2022 හා 2023 වර්ෂ අතරදී විදුලි ජනන පිරිවැය සැලකිය යුතු ලෙස වෙනස්වීම නිරීක්ෂණය කළ හැකි ය. එහිදි 2022 වර්ෂයේ දී ඉතා ඉහළ අගයක පැවති අතරමැදි යෙදවුම් අනුපාතය 2023 වර්ෂයේ දී අඩුවීමක් දැකිය හැකි ය. තව ද 2023 වර්ෂයේ දී නිමැවුමේ වටිනාකම ඉහළ යෑමට වඩා අඩු වේගයකින් අතරමැදි යෙදවුම් පිරිවැය ඉහළ යෑම නිසා පවත්නා මිල ගණන් යටතේ ඉතා ඉහළ වැඩිවීමක් මෙම ආර්ථික කටයුත්තේ වාර්තා වී ඇත. ස්ථාවර මිල ගණන් යටතේ සකස් කෙරෙන ඇස්තමේන්තු වලදී නිමැවුමේ සමස්ත වටිනාකම සියයට 62කින් පමණ වැඩිවන තත්ත්වයක් තුළ මිල දර්ශකය සියයට 102 කින් පමණ වැඩිවීමක් වාර්තා වී ඇති අතර එය සමස්තයක් වශයෙන් විදුලිය නිෂ්පාදනය ආර්ථික කටයුත්තේ සියයට 2.3 ක ඍණ වර්ධනයක් වාර්තා වීමට බලපා ඇත. මේ අතර 2022 වර්ෂයේ දී 34:48:18 ක් ලෙස වාර්තා වූ ජල විදුලිය: තාප විදුලිය: පුනර්ජනනීය විදුලිය අනුපාතය 2023 වර්ෂයේ දි 29:50:21 ක් ලෙස වෙනස් වී ඇත.

ජලය එකතු කිරීම, පිරිපහදු කිරීම සහ සැපයුම" උප ක්‍රියාකාරකම 2022 වර්ෂයේදී සියයට 7.3 වර්ධනයක් වාර්තා කර තිබූ අතර 2023 වර්ෂයේදී සියයට 17.6 ක පසුබැසීමක් වාර්තා කර ඇත. ජල සැපයුමේ පරිමාව 2022 වර්ෂයේ දී වාර්තා වූ 818,309(ඝන මීටර් දහස්) සිට 2023 වර්ෂයේ දී 803,223 (ඝන මීටර් දහස්) ලෙස සියයට 2.0කින් පමණ අඩු වී ඇත. 2023 වර්ෂයේදී මෙම ආර්ථික කටයුත්තේ නිමැවුම් වටිනාකම සියයට 76 කින් වැඩි වූ අතර අතරමැදි පරිභෝජන වියදම සියයට

99 කින් වැඩි විය. එහි දි තවදුරටත් නිමැවුම් මිල දර්ශකය සියයට 82 කින් වැඩි වී ඇති අතර, මෙහි අතරමැදි යෙදවුම් වලින් අඩකට වඩා නියෝජනය කරන විදුලිය උප දර්ශකය 2023 වර්ෂයේදී සියයට 95 කින් වැඩි වී ඇත.

රට තුල පැවති ආර්ථික අර්බුදය ඉදිකිරිම් කර්මාන්ත කටයුතු කෙරෙහි තවදුරටත් දැඩි අහිතකර බලපෑම් ඇතිකර තිබේ. එහෙයින් 2022 වසර හා සසඳන විට 2023 වසරේ දී ඉදිකිරිම් කර්මාන්තය සියයට 20.8ක පහල යෑමක් වාර්තා කර ඇත. මෙම වසරේදී සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල ප්‍රතිශතය සියයට 5.1ක් ලෙස වාර්තා විය. 2023 වසරේදී ආනයනික සිමෙන්ති සැපයුම සියයට 31.46 කින් හා දේශීය සිමෙන්ති සැපයුම සියයට 14.34 පහල ගොස් ඇත. ඒ අනුව සමස්ත සිමෙන්ති සැපයුම සියයට 19.66 ක අඩුවීමක් වසර තුළදී වාර්තා වී ඇත. තවද 2023 වසරේ ඉදිකිරීම් ද්‍රව්‍ය මිල ඉහළ යාම ද මෙම තත්ත්වයට හේතු වී තිබේ.

### 1.2.1 නිමැවුම කර්මාන්ත කටයුතු

පවතින ආර්ථික අර්බුදය 2023 වසරේ නිමැවුම් කර්මාන්ත කටයුතුවලට දැඩි ලෙස බලපා ඇත. කෙසේ වෙතත්, 2022 වසර හා සසඳන විට, සමස්ත නිමැවුම් කර්මාන්ත ක්‍රියාකාරකම් සියයට 3.2 ක හැකිලීමක් 2023 වසරේ දී පෙන්නුම් කර ඇත, තව ද මෙම ආර්ථික කටයුත්ත සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට සියයට 17.9ක දායකත්වයක් ලබා දී ඇති අතර 2023 වර්ෂයේ මුළු දළ දේශීය නිෂ්පාදිතයට පිළිවෙළින් වර්තන මිල සහ ස්ථාවර (2015) මිල අනුව රුපියල් මිලියන 4,950,993 සහ රුපියල් මිලියන 1,900,381 ලෙස වාර්තා වේ.

නිෂ්පාදන ක්‍රියාකාරකම් අතරින් විශාලතම උප ක්‍රියාකාරකම වන 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන ආර්ථික කටයුත්ත ' සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට සියයට 7.0 ක දායකත්වයක් ලබා දුන් අතර 2023 වර්ෂයේ දී සියයට 3.5 කින් ප්‍රසාරණය විය. දෙවන විශාලතම ක්‍රියාකාරකම වන රෙදිපිළි නිෂ්පාදනය, ඇඟලුම් සහ සම් නිෂ්පාදන' 2022 වසරේ වාර්තා වූ සියයට 8.0 ප්‍රසාරණයට සාපේක්ෂව 2023 වසරේ සියයට 12.0 ක හැකිලීමක් වාර්තා කර ඇත.

“ගල් අඟුරු නිෂ්පාදනය සහ ඛණිජ තෙල් පිරිපහදුව නිෂ්පාදන” කර්මාන්තය 2022 දී සියයට 58.2ක හැකිලීමක් වාර්තා වූ අතර 2023 දී බොරතෙල් ආනයනය පුළුල් කිරීම නිසා තෙල් පිරිපහදු කිරීමේ කටයුතු ප්‍රසාරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂයේදී සියයට 238.2 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත.

'මූලික ලෝහ සහ සැකසූ ලෝහ නිෂ්පාදන කර්මාන්තය 2023 වර්ෂයේ දී සියයට 2.6 ක වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර 2022 වසරේ දී සියයට 27.6 ක හැකිලීමක් වාර්තා කර ඇත.

අනෙකුත් සියලුම නිෂ්පාදන කටයුතු සලකා බැලීමේදී, ඒවායින් බොහොමයක් මෙම වර්ෂය තුළ කැපී පෙනෙන පසුබෑසීම් තත්ත්වයන් වාර්තා වේ. “දැව හා දැව නිෂ්පාදන හා ලීයෙන් කරන ලද නිෂ්පාදන” (ගෘහ භාණ්ඩ හැර) (සියයට 20.0) ' “කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි ප්‍රතිනිෂ්පාදනය (සියයට 9.2), “රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තය” ' (සියයට 16.8),” ‘යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය' (සියයට 15.1), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (7.8 සියයට), අනෙකුත් නිෂ්පාදන සහ අලුත්වැඩියාව (15.6 සියයට) වාර්තා කර ඇත.

## 1.3 සේවා ආර්ථික කටයුතු

2023 වර්ෂයේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 0.2ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. සේවා ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 16,557,308ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 7,200,438 ක් ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2023 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 59.9ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 04
**සේවා ආර්ථික කටයුතුවල වර්ධනය - 2023**




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

"තොග සහ සිල්ලර වෙළඳාම" සේවා ආර්ථික කටයුත්ත 2023 වසරේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 14.0ක පමණ දායකත්වයක් ලබා දී ඇති අතර 2022 වසරේ වාර්තාවූ සියයට 0.03ක වර්ධනය හා සැසඳීමේදී 2023 වසරේ දී සියයට 0.1ක වර්ධනයක් වාර්තා කර ඇත.

ආනයනවල වෙනස් වීම සහ දේශීය නිෂ්පාදිතයේ වෙනස් වීම තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බාහිර වෙළඳ සංඛ්‍යා ලේඛනවලට අනුව 2022 වසර සඳහා සමස්ත ආනයන වියදම රු. මිලියන 5,737,333 වූ අතර 2023 වසර සඳහා එය රු. මිලියන 5,492,588 දක්වා සියයට 4.3කින් අඩු වී ඇත. එසේම, මෙම වසර දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2022 වසරේ පැවති රු. මිලියන 872,256 සිට රු. මිලියන 993,212 දක්වා සියයට 13.9කින් වැඩි වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2022 වසර හා සසඳන විට 2023 වසර දී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 1.4කින් අඩු වී ඇති අතර, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 3.0කින් වැඩි වී තිබේ.

මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බාහිර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2022 වසර හා සසඳන විට 2023 වසර ලෝකයේ සෙසු රටවල් සඳහා වන මුළු අපනයන වටිනාකම සියයට 7.9කින් අඩු වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය සියයට 1.9කින් වැඩි වී තිබේ. එහිදී කාර්මික අපනයන පරිමා දර්ශකය මෙම වසර දී සියයට 2.3කින් වැඩි වී ඇති අතර, කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය මෙම වසර දී සියයට 0.3කින් අඩු වී ඇත.

"මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම" යන සේවා ආර්ථික කටයුත්ත, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම යන උප ආර්ථික කාර්යයන් ගෙන් සමන්විත වේ. 2023 වර්ෂයේ දී ගොඩබිම් ප්‍රවාහන කටයුතු ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පසුගිය වසර ට සාපේක්ෂව, පොදු මගී ප්‍රවාහන සේවා ධන වර්ධනයක් වාර්තා කිරීම මේ සඳහා බලපා ඇත. මේ අනුව දුම්රිය දෙපාර්තමේන්තුව හා ජාතික ගමනාගමන කොමිසම මගින් සකසනු ලබන මගී කිලෝ මීටර් ප්‍රමාණය පිළිවෙලින් සියයට 6.7ක් සහ සියයට 45.8ක් ලෙස වැඩි වී ඇත. මෙම වසරේ දී ගුවන් ප්‍රවාහනය ද ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර ශ්‍රී ලංකා ගුවන් සමාගමේ මගී කිලෝ මීටර් සංඛ්‍යාව සියයට 11.1 කින් වර්ධනය වී ඇත. ගබඩා පහසුකම් සැපයීම සහ අනෙකුත් ප්‍රවාහන සහාය සේවා කටයුතු 1.5ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මේ අනුව සමස්තයක් වශයෙන් ප්‍රවාහන කටයුතු 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී සියයට 3.9 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

“තැපැල් සහ කුරියර් සේවා සැපයීම” ආශ්‍රිත උප ආර්ථික කටයුතු, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සියයට 2.9ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ආර්ථික කටයුත්තේ නිමැවුමෙන් සියයට 44 ක දායකත්වයක් කුරියර් සේවා සැපයීම විසින් ලබා දී ඇති අතර එම උප ආර්ථික කටයුත්ත සියයට 9.7ක වර්ධනයක් ද පෙන්නුම් කර ඇත. එහෙත් තැපැල් සේවා සැපයීම් කටයුතු සියයට0.3කින් පහත වැටීමක් වාර්තා කර ඇත. තැපැල් දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව කාර්ය මණ්ඩල වියදම සියයට සියයට 0.2 අඩු වී ඇති අතර අනෙකුත් වියදම් සියයට 50කින් වැඩි වී ඇත. එනිසා අතරමැදි යෙදවුම් පිරිවැය ඉහල ගොස් ඇත.

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී ආර්ථිකයේ පැවැති යහපත් තත්ත්වය නිසා සංචාරක ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) සංඛ්‍යා දත්ත අනුව 2023 වර්ෂයේ විදේශීය සංචාරකයන් 1,487,303 ශ්‍රී ලංකාවට පැමිණි අතර එය 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 106.6 ක වර්ධනයකි. එමෙන්ම ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 වර්ෂය තුළ එම හෝටල්වල වාර්ෂික පිරිවැටුම 2022 වර්ෂයේ පිරිවැටුම හා සසඳන විට සියයට 72.2 කින් වර්ධනය වී ඇත. මෙම තත්ත්වය තුළ නවාතැන්, ආහාර පාන වර්ග සැපයීම ආර්ථික කටයුත්ත 2023 වර්ෂයෙහි සියයට 26.0 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

“ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම, වැඩසටහන් සකස් කිරීම සහ විකාශන කාර්යයන්” සේවා ආර්ථික කටයුත්ත 2023 වර්ෂයේ දී සියයට 2.1 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර එහිදී ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම සියයට 17.0 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර වැඩසටහන් විකාශන කාර්යයන් සියයට 7.6ක වර්ධනයක් වාර්තා කර ඇත.

2023 වර්ෂයේදී “විදුලි සංදේශ සේවා සැපයීම” උප ආර්ථික කටයුත්ත සියයට 2.2 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර එහිදී මෙම ක්ෂේත්‍රයේ මුළු ආදායම 2023 වර්ෂයේ දී සියයට 0.2 ක සුළු වැඩිවීමක් පමණක් වාර්තා කර ඇති අතර සමහර ප්‍රධාන ආයතන සෘණ ලාභයන් ද 2023 වර්ෂයේ දී වාර්තා කර ඇත. තව ද 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා ප්‍රමාණය සියයට 13.0 කින් අඩු වී ඇති අතර ජංගම දුරකථන සම්බන්ධතා ප්‍රමාණය ද සියයට 3.3 කින් අඩු වී ඇත. කෙසේ වෙතත් අන්තර්ජාලය සහ ඊ - තැපැල භාවිතා කරන සම්බන්ධතා ප්‍රමාණය 2023 වර්ෂයේ දී සියයට 5.5 කින් වැඩි වී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.5ක දායකත්වයක් සපයන තොරතුරු තාක්‍ෂණය (IT) සහ තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ සේවා (ITES) ඇතුළු “පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්”, 2022 වර්ෂය හා සසඳන විට 2023 වර්ෂයේ දී සියයට 21.4 ක හැකිලීමක් වාර්තා කර ඇත. වසරේ කාර්තු හතරේම, මෙම ක්‍රියාකාරකම් සෘණ වර්ධන අනුපාත වාර්තා කර ඇත. ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස දක්ෂ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ගේ සංක්‍රමණය ඉහළ වේගයකින් ඉහළ ගොස් ඇති අතර එය තොරතුරු තාක්ෂණ කර්මාන්තයට ද අහිතකර ලෙස බලපා ඇත. මීට අමතරව, මෑත කාලපරිච්ඡේදය පුරාවට විදේශ විනිමය රෙගුලාසි සහ අවිනිශ්චිත මෙහෙයුම් පරිසරය මෙම පසුබෑමට හේතු වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා අනුව 2022 වසර හා සසඳන විට 2023 වසර තුළදී එක්සත් ජනපද ඩොලරයේ අගයෙන් පරිගණක සේවා අපනයන ආදායම ඩොලර් මිලියන 1065.9 සිට ඩොලර් මිලියන 792.8 දක්වා සියයට 25.6 කින් අඩු වී ඇත.මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා අනුව 2022 වසර හා සසඳන විට 2023 වසරේ දී පරිගණක සේවාවලින් උපයන ලද අපනයන ආදායමේ වටිනාකම රු. මිලියන 341,574 සිට රු. මිලියන 259,488 දක්වා අඩු වී ඇත.

‘මූල්‍ය සේවා සැපයීම” ආර්ථික කටයුත්ත සඳහා බලපත්‍රලත් වාණිජ බැංකු (එල්සීබී), බලපත්‍රලත් විශේෂිත බැංකු (එල්එස්බී), වෙනත් ලියාපදිංචි මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව (සීඑස්ඊ) සහ ශ්‍රී ලංකාවේ ගෘහ නියෝජනය කරන පුද්ගලයින් විසින් සපයනු ලබන මූල්‍ය ආයතන විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන්හි දත්ත උපයෝගී කර ගනී. මෙම ආර්ථික කටයුත්ත 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ සියයට 10.0ක සෘණාත්මක වර්ධනයක් වාර්තා වේ. මෙම වර්ෂයේ ස්ථාවර මිල ගණන් යටතේ එකතුකළ අගය රුපියල් මිලියන 477,047ක් වූ අතර එය 2022 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 529,907ට වඩා පහළ අගයක් ගනී. මූල්‍ය සේවාවන්හි භාවිතාව, ණය හා අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව 2023 වර්ෂයේ ණය අත්තිකාරම් වටිනාකම සියයට 2.8කින් පසුබැස ඇති අතර, මුළු තැන්පතු වටිනාකම 8.7කින් වර්ධනය වී ඇත. 2023 වර්ෂයේ “හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය” සහ “හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය” පිළිවෙලින් සියයට 14.2 ක් සහ සියයට 11.6 ක් ලෙස සටහන් විය.

රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ කටයුතු වල මූර්ත එකතුකළ අගය 2023 වසරේ දී සියයට 26.0 ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙමගින් දළ දේශිය නිෂ්පාදිතයට දක්වනු ලබන වටිනාකමෙහි දායකත්වය ස්ථාවර මිල (2015) ගණන් යටතේ රුපියල් මිලියන 99,192 ක් වේ. පවත්නා මිල ගණන් යටතේ දළ දේශිය නිෂ්පාදිතයට සියයට 1.0 ක දායකත්වයක් ලබා දෙනු ලැබේ. රක්ෂණ සේවාව භාවිතය මැන දක්වන උපයනලද රක්ෂණ වාරික වටිනාකම හා උපයනලද හිමිකම් වටිනාකමෙහි එකතුව 2023 වසරේදී සියයට 9.0 කින් වර්ධනයවී ඇත. 2022 වසරේදී රුපියල් බිලියන

264.0 ක් ලෙස වාර්තාවූ සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික ලාභය 2023 වසරේදී, රුපියල් බිලියන 405.2 දක්වා සියයට 53.5 ක වර්ධනයක් වාර්තා වී ඇත. එමෙන්ම මෙම වසරේදී ජාතික පාරිභෝගික මිල දර්ශකයේ [NCPI] (සියලු අයිතම සඳහා) අගය සියයට 16.5 කින් වර්ධනයවී ඇත.

"දේපළ වෙළඳාම් කාර්යයන් (නිවාස අයිතිය ඇතුළත්)" 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වසරේදී සියයට 6.0 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ආර්ථික කටයුත්තේ ස්ථාවර මිළ යටතේ එකතු කළ අගය රුපියල් මිලියන 521,465 ක් වන අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.2 ක දායකත්වයක් මෙම ආර්ථික කටයුත්ත මගින් ලැබේ.

"වෘත්තීය සේවා" 2023 වසරේ දී සියයට 2.4ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ආර්ථික කටයුත්තේ ස්ථාවර මිළ යටතේ එකතු කළ අගය රුපියල් මිලියන 254,360 ක් වන අතර, වර්තන මිල යටතේ දළ දේශීය නිෂ්පාදනය සඳහා දායකත්වය 2.0 ක් වේ. මෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8 ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් "නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහනිර්මාන හා ඉංජිනේරු කාර්යයන්", "විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්" "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන්" සහ "ප්‍රකාශන කාර්යයන්", "පශු වෛද්‍ය කාර්යයන්". "කුලී හා බදු කාර්යයන්", "රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශන කාර්යයන්" සහ "ගොඩනැගීම් හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම්" යන කාර්යයන්ගෙන් ගෙන් සමන්විත වේ.

2022 වසර හා සසඳන විට, වසරේ පළමු හා දෙවන කාර්තු තුළ මානව සෞඛ්‍ය සේවා සෘණ වර්ධන වේගයක් ලෙස වාර්තා වී ඇති අතර තෙවන හා සිව්වන කාර්තු දෙක තුළ ධනාත්මක වර්ධන වේගයක් වාර්තා කර ඇත. ඒ අනුව සමස්තයක් ලෙස ගත් කල, මානව සෞඛ්‍ය ක්‍රියාකාරකම් සියයට 0.7 ක පසුබැසීමක් වාර්තා කර ඇත. සෞඛ්‍ය හා ඖෂධ ද්‍රව්‍ය සඳහා අත්‍යවශ්‍ය සැපයුම්වල හිඟය, සෞඛ්‍ය සේවාවල මිල ඉහළ යාම පෞද්ගලික සෞඛ්‍ය සේවාවන්හි මෙම පසුබෑමට හේතු වී ඇත. 'කොළඹ කොටස් හුවමාරුවේ' ලියාපදිංචි වී ඇති දිවයිනේ ප්‍රධාන රෝහල් හයක ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවලට අනුව, එම රෝහල්වල වාර්ෂික පිරිවැටුම මෙම වසර තුළදී සමස්තයක් වශයෙන් සියයට 16.4කින් ඉහළ ගොස් ඇත. මීට අමතරව වසර තුළදී ඊ-චැනලින් සේවයද 22.4 කින් වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, මෙම වසර තුළ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සෞඛ්‍ය උප දර්ශකයේ දර්ශක අගය 148.7 සිට 190.5 දක්වා සියයට 28.1 කින් ඉහළ ගොස් ඇත. 2022 සහ 2023 වසරවල පසුකාලීන කාලපරිච්ඡේදය තුළ සෞඛ්‍ය අංශයේ මිල මට්ටම්වල ඉහළ යාමක් ද දැකගත හැකිය.

"වෙනත් පුද්ගල සේවා කාර්යයන්" දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.4ක පමණ දායකත්වයක් සපයන අතර එය ප්‍රධාන උප ක්‍රියාකාරකම් තුනකින් සමන්විත වේ. එනම් "කලා හා පොදු විනෝදාත්මක කාර්යයන්", "අනෙකුත් පෞද්ගලික කාර්යයන්" සහ "සේවා යෝජකයන් ලෙස ඇති ගෘහ ඒකක වල කටයුතු" වශයෙනි. 2022 වර්ෂයට සාපේක්ෂව මෙම වසරේදි සේවාවන් ලබාගැනීමට පැමිණෙන පුද්ගලයින් ප්‍රමාණය අඩුවීම මෙම ආර්ථික කටයුත්ත කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකරනු ලැබීය. කෙසේ නමුත් මෙම ආර්ථික කටයුත්ත බාධාකාරි තත්ත්වයන් මධ්‍යයේ වුවද 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ 0.4ක සුළු වර්ධනයක් පෙන්නුම් කරයි.

### 2.1 2023 වසරේ සිව්වන කාර්තුවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු

2023 වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ වාර්තා වූ 12.4 ක සෘණ වර්ධන වේගය හා සසඳන විට, 2023 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී වර්ධන වේගය 4.5 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇති බවයි. 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,955,390 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2023 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී රුපියල් මිලියන 3,087,989 ක් දක්වා ඉහළ ගොස් ඇත. තව ද, පවත්නා මිල ගණන් යටතේ 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 6,521,664 ක් ලෙස වාර්තා වු අතර එය 2023 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී රුපියල් මිලියන 7,303,758 ක් දක්වා වැඩි වී ඇත. 2023 සිව්වන කාර්තුව තුළ කෘෂිකර්මාන්ත, කර්මාන්ත, සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 0.6, සියයට 7.9 හා සියයට 2.8 ක වර්ධන වේගයන් වාර්තා කර ඇත.

| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර |
|---|---|
| දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම | ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සංඛ්‍යාන මන්දිරය

අංක.306/71,පොල්දුව පාර

බත්තරමුල්ල

info@statistics.gov.lk

+94 11 2147000

+94 11 2147011

statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

තෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

National.accounts@statistics.gov.lk

+9411 2147071 +94 112877938